# සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය
# සබරගමුව පළාත් සභාව
# ගිණුම් නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම

සබරගමුව පළාත් සභා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ ගිණුම් නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට පහත සුදුසුකම් අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම් -**

- **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**
  1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

     **සමඟ**

     අදාල ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්ද
  2. ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වී තිබීම.

     **සමඟ**

     අදාල ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්ද

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**
  1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
  2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1 – 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**02. වයස් සීමාව**

- අවු.22 නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**03. වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ට නොඅඩු කාලයක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
iv. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**04. වැටුප් ක්‍රමය**

- රු.42,600 - 10*755 – 18*1,135 – 70,850/=

➢ ගිණුම්කරණ පැකේජ සම්බන්ධ දැනුම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

ඉහත සුදුසුකම් පූර්ණය කරණු ලබන ඔබගේ අයදුම්පත් 2024.03.01 දිනට පෙර ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත පත්‍රයක් හා ඉල්ලුම්කරණ සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත් හි පිටපත් සහිතව පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මඟින් යොමු කළ යුතුය. ඔබගේ අයදුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම් කෙලවරේ "ගිණුම් නිලධාරි තනතුර සඳහා අයදුම්පත්" යනුවෙන් සඳහන් කළ යුතුය.

විධායක අධ්‍යක්ෂ,
සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය,
පැරඩයිස්,
කුරුවිට.
(විමසීම්- 045-2262687)